ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය

කොළඹ

ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (11) 249-8100 ෆැක්ස්: +94 (11) 244-9070

විද්‍යුත් තැපැල: shenjy@state.gov https://lk.usembassy.gov

නිවේදන අංක: 20161123

අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනය (USAID) ප්‍රජාතාන්ත්‍රික යහපාලනය ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සමග හවුල් වැඩපිලිවෙලක් දියත් කරයි.

අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනය (USAID) ප්‍රජාතාන්ත්‍රික යහපාලනය ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සමග හවුල් වැඩපිලිවෙලක් දියත් කරයි.

නොවැම්බර් 23,2016: ශ්‍රී ලංකාවේ වගවීම හා ප්‍රජාතාන්ත්‍රික පාලනය ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සමග අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනය (USAID) රුපියල් බිලියන 1.92ක (ඩොලර් මිලියන 13ක) හවුල් වැඩසටහනක් අද දියත් කළේය.

මෙම වැඩසටහන ආරම්භ කිරීමේ උත්සවයේදී අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනයේ (USAID) අධ්‍යක්ෂ ඇන්ඩෲ සිසොන් “මෙම ව්‍යාපෘතිය මගින් ස්වාධීන කොමිෂන් සභාවලට, අමාත්‍යාංශවලට, ප්‍රාදේශීය සහ පළාත් සභාවලට අපගේ සහය ව්‍යාප්ත වන්නේය" යැයි ප්‍රකාශ කළේය. "ස්ත්‍රී පුරුෂ සහභාගිත්වයට සම අවස්ථා ලබා දීමට සහ දේශපාලන සහ නායකත්ව මට්ටම්වල අඩුවෙන් නියෝජනය වන පාර්ශ්වයන්ටත් අප සුපුරුදු පරිදී සහය ලබා දෙන්නෙමු."

ප්‍රජාතාන්ත්‍රික පාලනය හා වගවීම ශක්තිමත් කිරීමේ මෙම තුන් අවුරුදු ව්‍යාපෘතියේ (SDGAP) අරමුණු රජය සහ පාර්ලිමේන්තුව තුල මූලෝපායික සැලසුම් කිරීම හා සන්නිවේදනය වැඩි දියුණු කිරීම, වඩා ඵලදායී ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, ක්‍රියාදාමයන් හඳුන්වා දීම සහ පාර්ලිමේන්තුවේ සහ ප්‍රාදේශීය මට්ටම්වල කාන්තාවන් හා අනිකුත් ඌන නියෝජනයක් ඇති කණ්ඩායම්වල දේශපාලන සහභාගීත්වය වැඩි කිරීමයි.

අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ආංශීය කමිටුවල සභාපතිවරුන්, ස්වාධීන කොමිසම්වල සභාපතිවරුන් හා බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික වශයෙන් ආධාර සපයන්නන් ඇතුළු ප්‍රධාන පාර්ලිමේන්තු සාමාජිකයන් හා කාර්ය මණ්ඩලය සහභාගීවූ මෙම ආරම්භක උත්සවය පවත්වන ලදදේ ගරු කථානායක කරු ජයසූරිය මහතාගේ ප්‍රධානත්වයෙනි.

ධාරිතව, දැනුම් පදනම හා ක්‍රියා මාර්ග ශක්තිමත් කිරීමට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සමග සහායෝගයෙන් අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනය (USAID) මෑතදී ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියේ සාර්ථකත්වය මත මෙම නව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වනු ඇත. මෑතදී අවසන් වූ එම ව්‍යාපෘතියේ කැපී පෙනෙන අංග වන්නේ අලුත් ආංශීය අධීක්ෂණ කමිටු පිහිටුවීමට ආධාර කිරීම හා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යාවත්කාලීන කිරීමයි.

1956 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ සියලු ජනයාගේ යහපත වෙනුවෙන් කෘෂිකර්මය, ව්‍යවසාය සංවර්ධනය, පරිසරය හා ස්වාභාවික සම්පත්, අධ්‍යාපනය, සෞඛ්‍යය, යහ පාලනය හා මානුෂීය ආධාර යන ක්ෂේත්‍රයන්හි ඩොලර් බිලියන 2කට වැඩි ප්‍රමාණයක් එක්සත් ජනපද රජය ආයෝජනය කර තිබේ.